දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග - 2015 හා 2019 (පුනර් 2015) පරීක්ෂණය - 2020 පෙබරවාරි/මාර්තු
Bachelor of Arts General (External) Degree Part I – 2015 & 2019 (2015 Repeat) Examination–February/March 2020

# දේවිසා 2.2 - රාජ්‍ය පරිපාලනයේ මූලිකාංග
# PSG 2.2 - Elements of Public Administration

කාලය පැය තුන යි

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
පැහැදිලි අත් අකුරින් පිළිතුරු සැපයිය යුතුය

---

01. රාජ්‍ය පරිපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය හඳුන්වා දී එය හැදෑරීමේ වැදගත්කම පෙන්වා දෙන්න.

(ලකුණු 20 යි)

02. රාජ්‍ය පරිපාලනය සහ ව්‍යාපාර පරිපාලනය අතර ඇති සම අසමතා මොනවාද යි පැහැදිලි කරන්න.

(ලකුණු 20 යි)

03. "ටේලර්ගේ විද්‍යාත්මක කළමනාකරණ මූලධර්ම මගින් අපේක්ෂා කරන ලද්දේ වැඩ කාර්යක්ෂමතාව (Work - efficiency) ඉහල නැංවීම පමණක් නොව, එවැනි මූලධර්ම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි ශක්තිමත් සංවිධාන පසුබිමක් නිර්මාණය කිරීමය." විචාරාත්මකව විමසන්න.

(ලකුණු 20 යි)

04. සංවිධාන පිළිබඳ මානුෂවාදී ප්‍රවේශයේ සංවර්ධනය උදෙසා එල්ටන් මායෝගේ (Elton Mayo) හෝර්තෝන් අධ්‍යයන (Howthorne Studies) මගින් සිදු වූ දායකත්වය අගයන්න.

(ලකුණු 20 යි)

05. රාජ්‍ය පරිපාලනය සහ දේශපාලනය අතර ඇති සම්බන්ධයේ ස්වරූපය පිළිබඳව පවතින විවිධ අර්ථ නිරූපන පෙන්වා දෙන්න.

(ලකුණු 20 යි)

06. ශ්‍රී ලංකාවේ පලාත් සභා ක්‍රමය මගින් විමධ්‍යගත පරිපාලනය ක්‍රියාත්මක කිරීමේ සාර්ථක අසාර්ථකභාවය විශ්ලේෂණය කරන්න.

(ලකුණු 20 යි)

07. ඇමරිකාව තුළ එතෙක් ක්‍රියාත්මක වූ දූෂිත පරිපාලන ක්‍රමය (Spoiled System) වෙනස් කිරීම උදෙසා වූ පෙන්ඩල්ටන් පනතේ යෝජනා කොතෙක් දුරට ප්‍රායෝගික වූයේ ද? විමසන්න.

(ලකුණු 20 යි)

08. ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවා සැපයීමේ කඩිනම්බව සහ ගුණාත්මකබව වැඩිදියුණු කිරීමේ දී විද්‍යුත් ආණ්ඩුකරණ මූලෝපායන් කොතෙක් දුරට ප්‍රායෝගික වී දැයි විමසන්න.

(ලකුණු 20 යි)

09. ප්‍රංශ පරිපාලන ක්‍රමයේ ප්‍රධාන ලක්ෂණ මොනවා ද?

(ලකුණු 20 යි)

10. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් (02) පිළිබඳ විචාරාත්මක විමසීමක් කරන්න.

i. ශ්‍රී ලංකාවේ මැතිවරණ පරිපාලනය
ii. මැක්ස් වේබර්ගේ නිලබලක්‍රම න්‍යායේ මූලිකාංග
iii. පශ්චාත් Covid - 19 වසංගත තත්ත්වය තුළ ශ්‍රී ලංකාවේ සිවිල් සේවාවේ කාර්යභාරය
iv. ඒකාබද්ධ ආණ්ඩුකරණයේ (Integrated Governance) වැදගත්කම

(ලකුණු 10 බැගිනි)

*****************************************